# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1825/25 - 2013 අගෝස්තු මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2013.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2013 වර්ෂයේ අංක 02 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය

**නිවේදනයයි**

බස්නාහිර පළාතේ, ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු හේවා මාතරගේ උපාලි කොඩිකාර වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2013 අංක 02 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සඳහා බස්නාහිර පළාතේ, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලද 2013.07.24 දින සිට එම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

හේවා මාතරගේ උපාලි කොඩිකාර,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,
සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ
ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

බස්නාහිර පළාතේ 2013 අංක 02 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය
2013 මැයි මස 21 වැනි දින පැවති
බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013 ජූලි මස 17 වැනි දින,

එස්. අලවි මව්ලානා,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2013 ජූලි මස 24 වැනි දින.

1A - PG 001739 — 250 (2013/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2013 අංක 02 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය*

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

බස්නාහිර පළාත තුළ ග්‍රාමීය හා නාගරික ප්‍රජාවගේ ආර්ථික, සමාජීය, අධ්‍යාපනික, සදාචාරමය, සෞඛ්‍ය හා සංස්කෘතික කටයුතු දියුණු කිරීම සඳහා ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩල, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩල හා ග්‍රාම සංවර්ධන පළාත් බලමණ්ඩලය පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම සඳහා ද, ඊට සම්බන්ධ වූ හෝ අනුශාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද, 1998 අංක 05 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා වූ ද ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

*I වැනි කොටස*

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ "2013 අංක 02 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

අරමුණු හා කාර්යයන්

2. බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ ජනතාවගේ කුසලතා හා සව ශක්තිය වර්ධනය කරමින් ඔවුන්ගේම සැළසුම් සහගත ක්‍රියාකාරකම් පාදක කරගත් ආර්ථික සමාජීය, සංස්කෘතික හා අධ්‍යාත්මික වර්ධනයක් ඇති කිරීම මෙම ප්‍රඥප්තියේ අරමුණ වන්නේය. ඒ සඳහා, පහත කාර්යයන් හි නිරත විය හැක්කේය එනම්,

(අ) ග්‍රාම සංවර්ධන සමිති/කාන්තා ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම, ලියාපදිංචි කිරීම, පවත්වාගෙන යාම ;

(ආ) ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල සංවිධානය කිරීම, පිහිටුවා ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම ;

(ඇ) ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල සංවිධානය කිරීම, පිහිටුවීම හා ලියාපදිංචි කිරීම, පවත්වාගෙන යාම ;

(ඈ) ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය සංවිධානය කිරීම පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම ;

(ඉ) කාන්තා අභිවෘද්ධි පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම ;

(ඊ) ග්‍රාම සංවර්ධනය උදෙසා වැඩ සටහන් සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ;

(උ) ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික හා ජීවන උපාය මාර්ග නගාසිටුවීමේ පුහුණු හා අලෙවි මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම හා පුහුණු කිරීම වෙනුවෙන් සහතික පත් නිකුත් කිරීම අධීක්ෂණයට අමතරව සාමාජිකයන්ගේ මුදල්වල සුරක්ෂිතභාවය උදෙසා ග්‍රාම සංවර්ධනය සඳහා වූ බැංකු පිහිටුවීම එහි පාලන බලය ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත පැවරේ. ඒ අනුව ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ග්‍රාම සංවර්ධනය සඳහා වූ බැංකු පිහිටුවනු ලැබේ. එකී බැංකුවල අතිරික්ත අරමුදල් රාජ්‍ය බැංකුවක තැන්පත් කළ යුතු වේ ;

(ඌ) ග්‍රාමීය සංවර්ධනය උදෙසා සිදුකෙරෙන ග්‍රාමීය ඉතිරි කිරීම්, තැන්පතු රැස්කිරීම්, ආයෝජනය හා ණයදීම සහ ප්‍රවර්ධනය පිළිබඳ ආයතන කළමනාකරනය හා අධීක්ෂණය ;

(එ) ග්‍රාමීය සංවර්ධනය උදෙසා පිහිටුවන ලබන රාජ්‍ය හා රජය පිළිගත් දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය ;

(ඒ) පළාත් ග්‍රාම සංවර්ධන අරමුදලක් පිහිටුවීම හා පවත්වාගෙන යාම ;

(ඔ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්පත් කරගැනීමට දැරීමට බද්දට හෝ කුලියට දීමට හෝ ගැනීමට, උකස් කිරීමට, විකිණීමට හෝ අන්‍ය ආකාරයකින් බැහැර කිරීම.

*II වැනි කොටස*

පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම.

3. (1) මෙම ප්‍රඥප්තියේ අරමුණු හා කාර්යයන් ඉටුකිරීම සඳහා පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා හා (මින්මතු ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා) ඔහුට සහාය වනු පිණිස රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වූ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් මෙයින් පිහිටුවනු ලැබේ. (ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන අතර ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පංතියේ නිලධාරියෙකු විය යුතුය.)

(2) අමාත්‍යවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන වලට යටත්ව අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත අධ්‍යක්ෂවරයා මේ ප්‍රඥප්තිය පරිපාලනය කිරීම භාරව ක්‍රියා කළ යුතුය.

*නිලධාරීන් පත් කිරීම බලතල සහ කාර්යයන්.*

4. (1) දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටුකිරීම පිණිස අධ්‍යක්ෂවරයාට සහාය වීම සඳහා පත්කරනු ලබන රාජ්‍ය නිලධාරීන්, පළාත් ග්‍රාම සංවර්ධන සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාවය මත පත්කරනු ලබන ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන්, ග්‍රාම සංවර්ධන නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ මැහුම් උපදේශිකාවන් හා මැහුම් උපදේශිකාවන් සහ දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට සහායවීමට අවශ්‍ය යැයි සළකන වෙනත් නිලධාරීන්ගෙන් හා සේවකයන්ගෙන් සමන්විත විය යුත්තේය.

(2) අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධිවිධාන සහ පාලනයට යටත්ව අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධාරීන් විසින් මේ ප්‍රඥප්තිය සහ ඒ යටතේ සාදනු ලබන නියෝග විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු අතර ඒ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලය හා වගකීම ඔවුන් සතුවේ.

*පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා.*

(3) පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ, ග්‍රාම සංවර්ධන විෂයභාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ ය. ඔහුගේ බලතල හා කාර්යභාරය අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කළයුතු අතර, ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ඔහු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුත්තේය. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන සලකා බැලීම්වලදී ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් හා සේවකයින් රාජ්‍ය සේවකයින් වශයෙන් සැළකිය යුත්තේ ය.

## *III වැනි කොටස*

*ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම, බල ප්‍රදේශය හා ආරම්භක රැස්වීම.*

5. (1) බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය හා නාගරික ජනතාවගේ ආර්ථික, සමාජීය, සෞඛ්‍ය අධ්‍යාපනය, සදාචාරය, සංස්කෘතිය නගා සිටුවීම සඳහා සෑම ගමකම ග්‍රාම සංවර්ධන සමිතියක් හෝ කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියක් හෝ එසේ නොවේ නම් එම සමිති වර්ග දෙකම පිහුටුවනු ලැබිය හැකිය. කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියක් සඳහා ස්ත්‍රී පාර්ශ්වය පමණක් සාමාජිකත්වය දැරිය යුතුය.

(2) මෙහිදී ගම වශයෙන් ග්‍රාම සේවා වසම හෝ සම්ප්‍රදායිකව ජාති කුළ ආගම් වශයෙන් බෙදීම් සහිත ගම හෝ ගම් ගොඩැල්ල හෝ වතු ඒකක සහිත ජනාවාසයක් හෝ නාගරික ජනාවාසයක් පිළිගත යුතුය. ග්‍රාම සංවර්ධන සමිතියේ බල ප්‍රදේශය තීරණය කිරීමේදී ප්‍රාදේශීය ලේකම් විසින් ග්‍රාම නිලධාරීන්ට ග්‍රාම සංවර්ධන නිලධාරියාගේ ද සහාය ඇතිව ඉහත කරුණු සැලකිල්ලට ගෙන තීරණය කළ යුත්තේ ය.

(3) ග්‍රාම සංවර්ධන සමිතියක් පිහිටුවීමේ ආරම්භක රැස්වීමට තීරණය කරගත් බල ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාවෙන් අවම වශයෙන් පවුල් 20 ක් වත් නියෝජනය විය යුතු ය.

(4) උක්ත ගමේ වෙසෙන ජනතාවගේ ආර්ථික, සෞඛ්‍ය, අධ්‍යාපන, සදාචාරය සහ සංස්කෘතික කටයුතු දියුණු කිරීම උදෙසා ග්‍රාම සංවර්ධන සමිති විසින් කරනු ලබන ග්‍රාමීය මට්ටමේ එක් එක් සැලසුම් සඳහා නියමිත කාල සීමාවක් තිබිය යුතු අතර, එම සැලසුම සාර්ථක කර ගැනීම පිණිස අවශ්‍ය මූල්‍යාධාර හා වෙනත් ආධාර සැපයීම බස්නාහිර පළාත් සභාවේ ද, සමිතිය පිහිටි බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ ද යුතුකම වන්නේ ය. ස්වේච්ඡා සංවිධාන සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලට ද, ග්‍රාම සංවර්ධන සමිතිවලට උපකාර කිරීමේ හැකියාව ඇත්තේ ය.

*ග්‍රාම සංවර්ධන සමිති ව්‍යවස්ථාව, සමිති ලියාපදිංචිය සහ බලතල.*

6. (1) මෙකී ග්‍රාම සංවර්ධන සමිති උදෙසා මෙම ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ සඳහන් ව්‍යවස්ථාව එහි 01, 02 සහ 03 වන වගන්තිවලට පමණක් අදාළ වෙනස් කිරීම් සහිතව අදාළ කරගත යුතු ය.

(2) මෙකී ග්‍රාම සංවර්ධන සමිතිය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර, ඊට සමිතියේ පරමාර්ථවලට අනුකූලව ගිවිසුම්වලට එළඹීමට බලය ඇත. ග්‍රාම සංවර්ධන සමිතියේ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පැවරීමට හා පවරනු ලැබීමට හැක්කේ ය.

(3) එම ග්‍රාම සංවර්ධන සමිතියේ කාර්යයන් උදෙසා අදාළ ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන නිලධාරි විසින් ඒ ඒ වැඩසටහන්වලට සම්බන්ධ විෂය ක්ෂේත්‍රය පිළිබඳව දැනුමක් ඇති ඕනෑම නිලධාරියෙකු කැඳවා ගනු ලැබීමට අවස්ථාව ඇති අතර, එහිදී එකී නිලධාරියා ඔහුට අදාළ ක්ෂේත්‍රය පිළිබඳව උපදේශකවරයෙකු වන්නේ ය. එහෙත් සමිතියේ කටයුතු සම්බන්ධයෙන් ඔවුන්ට ඡන්ද බලය නොමැත්තේ ය.

(4) මෙම ප්‍රඥප්තියේ 3 වන කොටසේ 5 වන වගන්තියේ (1), (2), (3), (4) යන උපවගන්ති වල සඳහන් විධිවිධානයන්ට අනුව පිහිටුවන ලද ග්‍රාම සංවර්ධන සමිති ලියාපදිංචිය සඳහා පහත දැක්වෙන ලියකියවිලි නිසියාකාරව නිවැරදිව, පිටපත් 02 කින් සකස්කර ග්‍රාම සංවර්ධන නිලධාරීගේ නිර්දේශය සහිතව මසක් ඇතුලත අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය එනම්,

(අ) මෙම ප්‍රඥප්තියේ II වන උපලේඛනයේ සඳහන් ආකෘතියේ පරිදි වූ සමිති ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය
(ආ) සාමාජික නාම ලේඛනය
(ඇ) ආරම්භක රැස්වීම් වාර්තාව
(ඈ) සභා සම්මත කරගත් ව්‍යවස්ථාව
(ඉ) නිලධාරි මණ්ඩලයේ හා කාරක සභා සාමාජිකයන්ගේ නාමලේඛනය

එසේ ඉදිරිපත් කරන ලියවිලි ප්‍රාදේශීය ලේකම් විසින් පරීක්ෂා කර බලා සෑහීමකට පත්වීමෙන් පසු සුදුසුනම් අනුමත කර ලියාපදිංචි ලේඛනයේ සටහන් තබා ලියාපදිංචි කර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂට පිටපතක් සහිතව මෙම ප්‍රඥප්තියේ VI වන උපලේඛනයේ සඳහන් ආකෘතිය පරිදි වූ ලියාපදිංචි සහතිකයක් සමිතිය වෙත නිකුත් කළ යුතුය. යම් සමිතියක් නිලධාරීන් තෝරා ගත් දින සිට මාසයක් ගත වන තෙක් ලියාපදිංචි කිරීමට අපොහොසත් වුවහොත් එම නිලධාරී මණ්ඩලය අහෝසි වන්නේය. ඒ අනුව නැවත වරක් නිලධාරීන් තෝරා පත් කර ගත යුත්තේය.

ධූර කාලය.

(5) උක්ත 6. (4) ජේදයේ සඳහන් විධිවිධානයන්ට අනුව ලියාපදිංචි කරන ලද ග්‍රාම සංවර්ධන සමිතියක/කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියක, නිලධාරී මණ්ඩලයේ ධූර කාලය ඔවුන් තේරීපත් වූ දින සිට ලිත් වර්ෂ 02 ක් වන්නේය. එසේ ලිත් වර්ෂ 02 කින් ධූර කාලය අවසන් වූ නිලධාරීන් වෙනුවට මාස 03 ක් ඇතුලත නව නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගත යුත්තේ ය.

එලෙස මාස 03 ක් ඇතුලත නව නිලධාරී මණ්ඩලයක් තෝරා ගැනීමට අපොහොසත් වුවහොත් එකී මාස තුන ඉකුත් වූ දින සිට දින 14 ක් ඇතුලත ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාම සංවර්ධන නිලධාරී විසින් ග්‍රාම නිලධාරී මගින් මහ සභාවක් කැඳවා නව නිලධාරී මණ්ඩලයක් තෝරා ගත යුත්තේය.

ධූර කාලය අවසන් වුවද නව නිලධාරී මණ්ඩලයක් තෝරා ගන්නා තෙක් සමිතියේ සියලු කටයුතු සඳහා පැරණි නිලධාරී මණ්ඩලය වගකිව යුත්තේය.

(6) මෙම ප්‍රඥප්තියට අනුව ග්‍රාම සංවර්ධන සමිතියක් ආරම්භක කිරීමේ හෝ නව නිලධාරී මණ්ඩලයක් තෝරා ගැනීමේ හෝ රැස්වීමකට අදාළ ග්‍රාම සංවර්ධන නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් විසින් බලය පවරන ලද නිලධාරියෙකු හෝ එකී නිලධාරීන්ගෙන් එක් අයෙකුවත් සහභාගී විය යුත්තේය.

(7) ග්‍රාම සංවර්ධන සමිතියක් මුදල් වර්ෂය ලිත් වර්ෂයක් වන්නේය. ලිත් වර්ෂය අවසන්වී මාස 04 ක් ඇතුලත මුදල් වර්ෂය තුළදී කරන ලද ගනුදෙනු පිළිබඳ අයවැය වාර්තා විගණනය කොට සභා සම්මත කර ග්‍රාම සංවර්ධන නිලධාරී මගින් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. විගණන වාර්තාවන් පිළිබඳ සීමාවන් ගරු අමාත්‍යවරයා විසින් කලින් කලට පනවනු ලබන රීති මගින් නියම කළ යුතු වන්නේය. මෙම වගන්තියේ විධිවිධාන යම් සමිතියක් විසින් උල්ලංඝනය කරන අවස්ථාවේදී එම සමිතිය අත්හිටුවා පරීක්ෂණයකට යටත් කළ හැකිය.

(8) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම සංවර්ධන නිලධාරී නිල බලයෙන්ම ග්‍රාම සංවර්ධන සමිතියේ/කාන්තා සමිතියේ උපදේශක වන අතර සියලුම අධීක්ෂණ කටයුතු හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ වගකීම ඔහු සතු වන්නේ ය.

(9) ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ආරම්භ කර පවත්වාගෙන යන ඕනෑම ව්‍යාපෘතියක් ග්‍රාම සංවර්ධන සමිතියේ අධීක්ෂණය යටතේ විය යුතු ය.

(10) සමිති බල ප්‍රදේශය, සාමාජිකත්වය පිරිනැමීම, නිලධාරීන් තෝරාපත්කර ගැනීම, පරිහරණය කරන ලිපි ලේඛන, සමිතියට අයත් නිශ්චල චංචල දේපල හා සමිති ක්‍රියාකාරකම් පිළිබඳව ගැටළුවක් පැන නැඟුණු විට පළමුව ග්‍රාම සංවර්ධන නිලධාරී විසින් ද දෙවනුව ප්‍රාදේශීය ලේකම් විසින් ද ඒ පිළිබඳව තීරණය කිරීමට නොහැකි වූ අවස්ථාවක ඒ පිළිබඳ තීරණයක් ගැනීම පිණිස ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා වෙත යොමුකළ යුත්තේය. එම තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවේ නම් දින 30ක් ඇතුලත පළාත් විෂය භාර ලේකම්වරයාට එක් අභියාචනයක් පමණක් ඉදිරිපත් කළ හැකි වන අතර ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණය වන්නේය.

*IV වැනි කොටස*

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම ප්‍රාදේශීය බල මණ්ඩලවල පරමාර්ථ හා එහි කාර්යයන්.

7. (1) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළම ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක් පිහිටුවිය යුත්තේය. එම බල මණ්ඩල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටුවන ලද ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා ග්‍රාම සංවර්ධන සමිති වල සභාපති වරුන්ගෙන් හා ලේකම්වරුන්ගෙන් සමන්විත වන්නේය.

(2) ප්‍රාදේශීය බල මණ්ඩල අරමුණු :

(අ) ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා ග්‍රාම සංවර්ධන සමිති ප්‍රවර්ධනය කිරීම සඳහා ආධාර ලබාදීම හා මග පෙන්වීම.
(ආ) එම සමිති වල පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සහාය දීම.
(ඇ) දිස්ත්‍රික් බල මණ්ඩල නියෝජනය කිරීම.
(ඈ) ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීම.
(ඉ) ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික, සාමාජීය, සංස්කෘතික, ආයතනික තත්ත්වයන් නංවාලීම.
(ඊ) වෙනත් සමිති සමාගම් සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම හා ඒ තුළින් ප්‍රාදේශීය සංවර්ධනය ගොඩනගා ගැනීම.

(3) මෙකී ප්‍රාදේශීය බල මණ්ඩල උදෙසා මෙම ප්‍රඥප්තියේ III වන උපලේඛනයේ සඳහන් ආකෘතිය පරිදි වූ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළකරන ලද ප්‍රාදේශීය බල මණ්ඩල ව්‍යවස්ථාවක් තිබිය යුතුයි. එම ව්‍යවස්ථාව සමිති පිහිටුවීමේදී බහුතරය විසින් පිළිගත යුතුය. අධ්‍යක්ෂවරයා විසින් ගැසට් පත්‍රයේ පළකර ඇති ව්‍යවස්ථාවේ යම් වෙනසක් සිදුකළ යුතුනම් සාමාජිකයින්ගේ 3/4 ක් සහභාගිවන රැස්වීමකදී පැමිණ සිටින සංඛ්‍යාවෙන් 2/3 ක් ඡන්දයෙන් ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකිය. එම සංශෝධන ව්‍යවස්ථාවට පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලැබූ දිනයේ සිට බලාත්මක වන්නේය.

(4) ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයේ සභාපතිවරයා ග්‍රාම සංවර්ධන සමිති/කාන්තා ග්‍රාම සංවර්ධන සමිති සභාපතිවරුන්/ලේකම්වරුන් අතරින් පත්විය යුතු අතර ප්‍රාදේශීය බල මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් එම ප්‍රාදේශීය බල මණ්ඩලය පිහිටි කොට්ඨාසයේ ග්‍රාම සංවර්ධන නිලධාරි නිල බලයෙන් පත්විය යුතුය. එම ප්‍රාදේශීය බල මණ්ඩලය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා නිල බලයෙන් එහි අනුශාසක විය යුත්තේය.

ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල පිහිටු වීම සහ එහි පරමාර්ථ හා කාර්යයන්.

(5) ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල වල සභාපතිවරුන් හා ලේකම්වරුන්ගේ නියෝජනයෙන් දිස්ත්‍රික් බල මණ්ඩලය පිහිටුවනු ලැබේ.

(6) දිස්ත්‍රික් බල මණ්ඩලයේ අරමුණු වන්නේ,

(අ) දිස්ත්‍රික්කය තුළ ග්‍රාම සංවර්ධන සමිති ප්‍රවර්දනය සඳහා සහාය දී උපදෙස් හා ආධාර දීම හා මග පෙන්වීම.
(ආ) ප්‍රාදේශීය බල මණ්ඩල වල ග්‍රාම සංවර්ධන සැළසුම් එකතු කර දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන සැළැස්ම සකස් කිරීම.
(ඇ) දිස්ත්‍රික්කයේ පවතින පරිපාලන සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික් සංවර්ධන සැළැස්ම සකස් කිරීම.
(ඈ) දිස්ත්‍රික්කය තුළ ඇති අනෙකුත් සමිති සමාගම් සහ සංවිධාන සමඟ සහයෝගය වර්ධනය වන පරිදි කටයුතු කරමින් දිස්ත්‍රික් සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබාදීම.
(ඉ) පළාත් බල මණ්ඩලය නියෝජනය කිරීම.

(7) මෙකී ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩලය උදෙසා මෙම ප්‍රඥප්තියේ IV වන උපලේඛනයේ සඳහන් ආකෘතිය පරිදි වූ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවක් තිබිය යුතු අතර එම ව්‍යවස්ථාව දිස්ත්‍රික් බල මණ්ඩලය පිහිටුවීමේදී බහුතරය විසින් පිළිගත යුතුය. අධ්‍යක්ෂවරයා විසින් ගැසට් පත්‍රයේ පළකර ඇති ව්‍යවස්ථාවේ යම් වෙනසක් සිදුකළ යුතු නම් සාමාජිකයන්ගෙන් 3/4 ක් සහභාගිවන රැස්වීමක දී පැමිණ සිටින සංඛ්‍යාවෙන් 2/3 ක ඡන්දයෙන් ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකිය. එම සංශෝධිත ව්‍යවස්ථාවට පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලැබූ දිනය සිට බලාත්මක වන්නේය.

(8) දිස්ත්‍රික් බල මණ්ඩලයේ සභාපතිවරයා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල වල සභාපතිවරුන් අතරින් පත්විය යුතු අතර, දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි හෝ ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂ නිල බලයෙන් එහි ලේකම් වන්නේය. දිස්ත්‍රික් ලේකම් නිල බලයෙන් එහි අනුශාසක වන්නේය.

ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩල පිහිටු වීම හා එහි කාර්යයන්.

8. (1) සෑම දිස්ත්‍රික් බල මණ්ඩලයකම සභාපතිවරුන් හා ලේකම්වරුන් ඇතුළුව පහත සඳහන් අයගේ නියෝජනයෙන් පළාත් බල මණ්ඩල පිහිටුවනු ලැබේ.

(අ) පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ
(ආ) පළාත් සහකාර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරු
(ඇ) දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන්

(ඈ) දිස්ත්‍රික් බල මණ්ඩල සභාපතිවරුන් හා ලේකම්වරුන්
(ඉ) දිස්ත්‍රික් තුනේ බල මණ්ඩල සාමාජිකයින් අතරින් දිස්ත්‍රික් 3 නියෝජනය වන පරිදි අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරන ලද තිදෙනෙක්

(2) පළාත් බල මණ්ඩල අරමුණු,

(අ) ජාතික ප්‍රතිපත්ති අනුව පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රතිපත්තිය සකස් කිරීම.
(ආ) එම පළාත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
(ඇ) පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල පාලනය කිරීම.
(ඈ) පළාතේ ග්‍රාම සංවර්ධනයේලා අවශ්‍ය වන විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම, සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
(ඉ) පළාතේ ග්‍රාම සංවර්ධන පුහුණු කටයුතු සහ පර්යේෂණ කටයුතු සිදුකිරීම.

(3) මෙකී ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩල උදෙසා මෙම ප්‍රඥප්තියේ V වන උපලේඛනයේ සඳහන් ආකෘතිය පරිදි වූ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවක් තිබිය යුතු අතර එම ව්‍යවස්ථාව පළාත් බල මණ්ඩලය පිහිටුවීමේදී බහුතරය විසින් පිළිගත යුතුය. ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් ගැසට් පත්‍රයේ පළකර ඇති ව්‍යවස්ථාවේ යම් වෙනසක් සිදුකළ යුතුනම් සාමාජිකයින්ගෙන් 3/4ක් සහභාගි වන රැස්වීමක දී පැමිණ සිටින සංඛ්‍යාවෙන් 2/3 ක ඡන්දයෙන් ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකිය. එම සංශෝධිත ව්‍යවස්ථාව පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ ඇනුමැතිය ලැබූ දිනයේ සිට බලාත්මක වන්නේය.

(4) පළාත් බල මණ්ඩලයේ සභාපතිවරයා ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල සභාපතිවරුන් අතරින් තේරී පත්විය යුතු යි. පළාත් බල මණ්ඩලයේ ලේකම් සහකාර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ වන්නේය. අනුශාසක පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ වන්නේය. පළාත් බල මණ්ඩලයේ ගනපූර්ණය 06ක් විය යුතුය. සෑම මසකටම වරක් ග්‍රාම සංවර්ධන පළාත් බලමණ්ඩලය රැස්විය යුතුය.

*V වැනි කොටස*

පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල සහ ගිණුම පිහිටුවීම.

9. (1) මෙම ප්‍රඥප්තිය සඳහන් පරමාර්ථ ඉෂ්ඨ කරගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම හා අවශ්‍ය වියදම් දැරීම සඳහා මෙහි මින් මතු ග්‍රාම සංවර්ධන අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන පළාත් ග්‍රාම සංවර්ධන අරමුදලක් මෙයින් පිහිටවනු ලැබේ. එම අරමුදල යටතේ පළාත් ග්‍රාම සංවර්ධන ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යා යුතුය.

(2) මෙම අරමුදලට පහත දැක්වෙන ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් ප්‍රේෂණය කළ යුතුයි.

(අ) රජයෙන් ලැබෙන ප්‍රතිපාදනයන්,
(ආ) පළාත් සභා අරමුදලින් කරනු ලබන ප්‍රදාන,
(ඇ) ගිවිසුම්ගත සේවා වලින් ලැබෙන ප්‍රතිලාභයෙන් 1/5 ක්,
(ඈ) දේශීය හා විදේශීය පුද්ගලයන්ගෙන් හෝ ආයතන මගින් හෝ (පරිත්‍යාග හෝ ආධාර) ලැබෙන මුදල්,
(ඉ) වෙනත් නෛතික මාර්ගයකින් ලැබෙන ආදායම්,

(3) පහත සඳහන් වියදම් පළාත් බලමණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියෙන් ග්‍රාම සංවර්ධන අරමුදලින් සිදුකළ හැක්කේය.

(අ) ග්‍රාම සංවර්ධන සමිති/කාන්තා ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බල මණ්ඩලවල, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලවල නිර්දේශය මත මුදල් ආයෝජනය කිරීම,
(ආ) පළාතේ ග්‍රාම සංවර්ධන වැඩ සටහන්, වෘත්තීය පුහුණු හා පර්යේෂණ වැඩසටහන්,
(ඇ) ග්‍රාම සංවර්ධන සමිතිවල/කාන්තා සංවර්ධන සමිතිවල අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කරනු ලබන පුහුණු වැඩ සටහන්,
(ඈ) ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය/දිස්ත්‍රික්/පළාත් බල මණ්ඩල සඳහා වූ පරිපාලන වියදම්,
(ඉ) ග්‍රාම සංවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ඉවහල්වන සමාජීය, ආර්ථික, සංස්කෘතික, හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා වූ වියදම්.

(4) ග්‍රාම සංවර්ධන අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතුය. ග්‍රාම සංවර්ධන අරමුදල මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන රාජ්‍ය බැංකු වල පමණක් පවත්වාගෙන යා යුතුය.

(5) අරමුදලේ වහාම අවශ්‍ය නොවන්නා වූ මුදල් 9.(4) හි දැක්වෙන රාජ්‍ය බැංකුවක හෝ ඒවායේ රාජ්‍ය අරමුදල් ලෙස ආයෝජනය කළ හැකිය.

(6) අරමුදලින් කරනු ලබන ගෙවීම් පරිපාටි රීති මගින් නියම කරනු ලැබිය යුතුය.

(7) ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව යටතේ විගණකාධිපති වරයාට ඇති බලතල බලපවත්වන්නේය. ගිණුම් විගණනය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කම් සහිතව අදාළ විය යුතුය.

(8) (7) උප වගන්තියේ සඳහන් පරිදි යම් ලිත් වර්ෂයක් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු පසු එම කරුණුවලට අදාළ පැහැදිලි කිරීම් සහ පරිපාලනය කිරීම පිළිබඳව අධ්‍යක්ෂවරයාගේ වාර්තාවක් පහත දැක්වෙන ලේඛන සමග අමාත්‍යාංශයේ ලේකම් මගින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේය.

විගණකාධිපතිවරයාගේ වාර්තාව,<br>ශේෂ පත්‍රය හා ආදායම් වියදම් ගිණුම.

(9) (8) උප වගන්තිය යටතේ තමා වෙත එවන ලද වාර්තාවේ හා ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පළාත් සභාව වෙත ඉදිරිපත් කරණු ලැබිය යුතුය.

*VI වැනි කොටස*

(10) (1) යථා පරිදි ලියාපදිංචි කරන ලද ග්‍රාම සංවර්ධන සමිතියක මුදල් සම්බන්ධව අයථා පරිහරණය, වංචාව, අල්ලස හා දූෂණ සිදුවී ඇතැයි වාර්තා වී ඇති අවස්ථාවක සුදුසු නිලධාරීන් මගින් ප්‍රාරම්භක වාර්තාවක් ලබාගැනීමෙන් අනතුරුව එසේ වංචාව, අල්ලස හෝ දූෂණ සිදුවී ඇති බවට සෑහීමකට පත්විය හැකි ප්‍රමාණවත් කරුණු ඇතිවිටක හෝ මාස 06 ක කාලයක් තුළ සමිති අක්‍රියව ඇති විටක හෝ ග්‍රාම සංවර්ධන නිලධාරි මගින් එම ග්‍රාම සංවර්ධන සමිතියේ සියළු කාර්යයන් අත්හිටුවා, විශේෂ මහා සභාවක් කැඳවා නව නිලධාරි මණ්ඩලයක් තෝරා පත් කර ගැනීමට ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාට/ප්‍රාදේශීය ලේකම්ට අවශ්‍ය විධිවිධාන සැලැස්විය හැකි ය. තවද මුදල් අයථා පරිහරණය, වංචාව, අල්ලස හා දූෂණය සම්බන්ධයෙන් වන අවස්ථාවක තත් කාලයේ වලංගුව පවත්නා නීතිය යටතේ අදාළ නිළධාරීන්ට විරුද්ධව තව දුරටත් නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂකට/ප්‍රාදේශීය ලේකම්වරයාට බලය ඇත්තේය. ග්‍රම සංවර්ධන සමිති විසුරුවා හැරීම.

(2) ව්‍යවස්ථානුකූලව පත්වූ ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක හා දිස්ත්‍රික් බල මණ්ඩලයක මුදල් අයථා පරිහරණය, වංචාව, අල්ලස හා දූෂණය සිදුවී ඇතැයි වාර්තාවූ විටෙක ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විශේෂයෙන් බලය පවරන ලද නිලධාරියෙකු මගින් ප්‍රාරම්භක වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව එසේ වංචාව, අල්ලස දූෂණය සිදුවී ඇති බවට සෑහීමකට පත්විය හැකි ප්‍රමාණාත්මක කරුණු ඇති විටෙක හෝ මාස 06ක් එකී බල මණ්ඩලය අක්‍රීයව ඇති බවට ප්‍රමාණවත් කරුනු ඇති විටෙක ද එකී බල මණ්ඩල විසුරුවා හැරීමට අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේය.

(3) විසුරුවා හරින ලද ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයකට හෝ ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩලයකට අයත් සියළුම චංචල හා නිශ්චල දේපල, ගිණුම් ලේඛන සාමාජික නාම ලේඛන, පරිහරණයට අදාළ සියළුම ලිපිගොනු ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ වෙත පැවරේ. ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියෙකුට එම දේපළ භාරදී නිදහස් වනතුරු විසුරුවා හරින ලද එහි එකී බලමණ්ඩල වල නිලධාරීන් සිය වගකීමෙන් නිදහස් නොවිය යුතුය.

(4) මුදල් සාවද්‍ය පරිහරණය හෝ වංචාව හෝ අක්‍රමිකතා හෝ සම්බන්ධයෙන් යටතේ විසුරුවා හරිනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිතියක, ප්‍රාදේශීය බල මණ්ඩලයක හෝ පළාත් බල මණ්ඩලයක නිලධාරීන්ට විරුද්ධව තත් කාලයේ වලංගු නීතිය යටතේ තවදුරටත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂට බලය ඇත්තේය.

(5) ව්‍යවස්ථානුකූලව පත්වූ ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයක මුදල් සාවද්‍ය පරිහරනය හෝ වංචාව හෝ අක්‍රමිකතා හෝ සිදුවී ඇතැයි වාර්තා වූ විටක ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා හෝ ලේකම්වරයා විසින් විශේෂයෙන් බලය පවරන ලද නිලධාරියෙකු මගින් ප්‍රාරම්භක වාර්තාවක් ලබාගැනීමෙන් අනතුරුව එසේ මුදල් සාවද්‍ය පරිහරණය හෝ වංචාව හෝ අක්‍රමිකතාවයන් සිදුවී ඇති බවට සෑහීමකට පත්විය හැකි ප්‍රමාණවත් කරුණු ඇති විටෙක හෝ මාස 06 ක කාලයක් එකී බල මණ්ඩලය අක්‍රියව ඇති බවට ප්‍රමාණවත් කරුණු ඇති විටෙක එම බල මණ්ඩලය විසුරුවා හැරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට බලය ඇත්තේය.

(6) 10. (5) වගන්තිය යටතේ විසුරුවා හරින ලද ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයට අයත් සියළුම චංචල හා නිශ්චල දේපල, ගිණුම් ලේඛන, සාමාජික නාම ලේඛන, පරිහරණයට අදාළ සියළුම ලිපිගොනු අමාත්‍යාංශ ලේකම් වෙත පැවරේ අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකුට එම දේපළ භාරදී නිදහස් වන තුරු විසුරුවා හරින ලද නිලධාරී මණ්ඩලය සිය වගකීමෙන් නිදහස් නොවිය යුතුය.

(7) 8. (1) වන උපවගන්තිය යටතේ ව්‍යවස්ථානුකූලව පත්වූ ග්‍රාම සංවර්ධන පළාත් බලමණ්ඩලයේ මුදල් සම්බන්ධව සාවද්‍ය පරිහරනයන් හෝ වංචාව හෝ අක්‍රමිකතා සිදුවී ඇති විටෙක ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ හෝ ලේකම් විසින් විශේෂයෙන් බලය පවරන නිලධාරියෙකු මගින් ප්‍රාරම්භක වාර්තාවක් ලබාගැනීමෙන් අනතුරුව එකී

පළාත් බලමණ්ඩලය ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් විසුරුවා ඇති විටෙක එකී මුදල් සාවද්‍ය පරිහරණය හෝ වංචාව හෝ අක්‍රමිකතා සම්බන්ධව තත්කාලයේ වලංගුව පවත්නා නීතිය යටතේ තවදුරටත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ලේකම්වරයාට බලය ඇත්තේය.

රීති

11. (1) නියම කළයුතු යැයි මෙම ප්‍රඥප්තියේ 11(2) වගන්තිය යටතේ සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැක්කේය.

(2) ඉහත උපවගන්තියෙන් පැවරුණු බලතල වලට යටත්ව පහත දැක්වෙන කරුණුවලට රීති සාදනු ලැබිය හැක්කේය.

(අ) ග්‍රාම සංවර්ධන සමිතියක්/කාන්තා ග්‍රාමසංවර්ධන සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි, කොන්දේසි හා ආකෘති පත්‍ර.

(ආ) ලියාපදිංචියට ඉල්ලීම් කරනු ලබන සමිතියක අවම සාමාජිකත්වය.

(ඇ) ග්‍රාම සංවර්ධන සමිති/කාන්තා ග්‍රාම සංවර්ධන සමිති මගින් පිහිටුවා ගන්නා කුඩා කණ්ඩායම් ඒකක තුළින් සාමාජික මුදල්, ඉතිරි කිරීම්, රැස්කිරීම් හා ණය දීම්.

(ඈ) ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බලමණ්ඩල වල, දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බලමණ්ඩලවල, පළාත් ග්‍රාම සංවර්ධන බලමණ්ඩලවල කාර්ය පටිපාටිය නියම කිරීම.

(ඉ) ග්‍රාම සංවර්ධන සමිතියක/කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියක, ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බලමණ්ඩලවල, දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බලමණ්ඩලවල, පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලයේ අදාළ ආදර්ශ ව්‍යවස්ථා පිළිබඳව.

(ඊ) ග්‍රාම සංවර්ධන සමිති අරමුදල් විගණනය පිළිබඳව.

(උ) මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකිරීම පිණිස හා ප්‍රඥප්තියට ගැනෙන කවර හෝ කාර්යයක් සම්බන්ධව.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම *ගැසට් පත්‍රයේ* පළකළ යුතුය. එසේ පළකරනු ලබන දිනයේදී හෝ රීතිවල සඳහන් පසු දිනකදී එය ක්‍රියාත්මක විය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම, එකී රීති *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු හැකි ඉක්මණින් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ සෑම රීතියක්ම ඒ අනුමැතියේ දින සිට, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්චින්න කරනු ලැබූ ලෙස සැළකිය යුතුය.

12. මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදනු ලබන රීති, නියෝග හා විධිවිධානයන් යටතේ තමන්ගේ අභිමතය පරිදි ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් කරන ලද යම් නියමයක් හෝ තීරණයක් සම්බන්ධයෙන් එම තීරණය ලබාදුන් දිනෙන් මසක් ඇතුලත අභියාචනයක් කරනු ලැබූ අවස්ථාවක හෝ එම තීරණය හෝ නියමය නුසුදුසු බව ලේකම්වරයාට හැඟීයන අවස්ථාවක එම තීරණය හෝ නියමය පරිච්චින්න කිරීම හෝ වෙනස් කිරීමේ අභිමතය අමාත්‍යාංශ ලේකම්වරයා සතුය.

13. 1998 අංක 05 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය මෙයින් පරිච්චින්න කරනු ලැබුවද එකී ප්‍රඥප්තිය යටතේ කරගෙන යනු ලැබූ සියලු කාර්යය මෙම ප්‍රඥප්තිය යටතේ කරනු ලැබූ හා කරගෙන යනු ලැබිය යුතු කාර්යය ලෙස සලකනු ලැබිය යුත්තේය. එලෙසම එකී ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ඇති ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස සළකනු ලැබිය යුත්තේය.

අර්ථ නිරූපනය.

14. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස

"අමාත්‍යවරයා" යන්නෙන් අදහස් වන්නේ බස්නාහිර පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාය.

"අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන් අදහස් වන්නේ බස්නාහිර පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාය.

"අධ්‍යක්ෂ" යන්නෙන් හඳින්වෙන්නේ තත්කාලයේ බස්නාහිර පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ ඔහු වෙනුවෙන් විධිමත්ව වැඩබැලීම සඳහා පත්කරන ලද නිලධාරියෙකු වේ.

"සහකාර අධ්‍යක්ෂ" යන්නෙන් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂට සහාය වීම පිණිස හා එම කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම පිණිස පත්කරන ලද නිලධාරීන් අදහස් වේ.

"දේපළ" යන්නෙන් අදහස් වන්නේ ග්‍රාම සංවර්ධන සමිතිය, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය, දිස්ත්‍රික් බලමණ්ඩලය හා පළාත් බලමණ්ඩලය සතු පොත්පත්, ලිපි ලේඛණ, අත ඉදිරිමුදල්, බැංකු හා වෙනත් මූල්‍ය ආයතනවල ඇති මුදල්, ලීබඩු, වාහන, උපකරණ, ගොඩනැගිලි හා ඉඩකඩම් ආදී සිය දේපළය.

"ග්‍රාමය" යන්නෙන් අදහස් වන්නේ ග්‍රාම නිලධාරී වසම හෝ සම්ප්‍රදායික පොදු බැඳීම් සහිත ගම හෝ ගම්ගොඩැල්ල හෝ වතු ඒකකය සහිත ගම හෝ ජනාවාසයක් හෝ නාගරික බල ප්‍රදේශයක පිහිටි වතු ඇතුළත් සමිති බල ප්‍රදේශය වේ.

"ග්‍රාම සංවර්ධන සමිතිය" යන්නෙන් අදහස් වන්නේ ගමේ පදිංචි පුරුෂ හා ස්ත්‍රී දෙපාර්ශවයේ නියෝජනයෙන් පිහිටුවා ගන්නා ලද ග්‍රාම සංවර්ධන සමිතිය වේ.

"කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය" යන්නෙන් අදහස් වන්නේ සමිති බල ප්‍රදේශයේ පදිංචි කාන්තාවන්ගේ නියෝජනයෙන් පිහිටුවා ගන්නා ලද කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය වේ.

15. මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි, භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**පළමු වන උපලේඛනය**

*ග්‍රාම සංවර්ධන සමිති ආදර්ශ ව්‍යවස්ථා මාලාව*

01. නාමය :-
02. ලිපිනය :-
03. බල ප්‍රදේශය :-
04. පරමාර්ථ :-

I. සමිති බල ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික, සාමාජීය, සෞඛ්‍ය, අධ්‍යාපන, සදාචාරාත්මක හා සංස්කෘතික අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියා කිරීම.
II. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ආයතන මගින් සැපයෙන සේවාවන් හා සම්පත් උපයෝගී කර ගනිමින්, ස්වශක්තිය මත පදනම්ව සාමූහික ප්‍රයත්නයන් තුළින් ගම්වාසීන්ගේ ආර්ථික, සෞඛ්‍ය හා සාමාජීයීය සංවර්ධනය ඇති කිරීමට කටයුතු කිරීම.
III. ග්‍රාමීය සංවර්ධන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත රැස් කිරීම, සම්පත් හඳුනාගැනීම මගින් සංවර්ධනය වැඩ සටහන් සැකසීම හා ජනතාව දැනුවත් කිරීම මගින් පුද්ගලයා, පවුල, හා බල ප්‍රදේශයේ සියළු ප්‍රජාව නගා සිටුවීමට කටයුතු කිරීම.
IV. ප්‍රදේශයේ ජනතාවගේ සමගිය ඇති කිරීම සඳහා අවශ්‍ය සහය සියළු පාර්ශවයන්ට ලබා දෙමින් ක්‍රියා කිරීම.
V. සාමකාමී සහ ජීවනයට අවශ්‍ය සමාජ සාරධර්ම පිරිහීමට යා නොදී රැක ගැනීම සඳහා කටයුතු කිරීම.

05. කාර්යභාරය :-

i. පොදු පහසුකම් හා වෙනත් සේවාවන් සැපයීම, රජයේ ව්‍යාපෘති සහ විවිධ සහය පද්ධතීන් සේවා ගමට ලබා දීම.
ii. පරිසරය සංරක්ෂණය කිරීම හා සංවර්ධනය කිරීමට සහාය වීම.
iii. රජයේ දේපළ ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීමට සහාය වීම.
iv. සමාජ, සංස්කෘතික හා ආර්ථික දත්තයන් එකතු කර ග්‍රාමීය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
v. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභාව, පළාත් පාලන ආයතන රජය වෙත සමිති බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම හා ගම්වාසීන්ගේ ප්‍රයෝජනය සඳහා වන මහජන උපයෝගී වැඩ ඉටු කිරීම.
vi. සමිති සාමාජිකයන්ගේ ආර්ථික ඵලදායීතාව වැඩි කිරීමට පියවර ගැනීම හා රැකියා අවස්ථා ඇති කිරීමට පියවර ගැනීම.
vii. සංවර්ධන වැඩ සටහන් සැකසීමේදී අදාළ අංශ වල රාජ්‍ය හෝ සංස්ථා හෝ මණ්ඩලවල නිලධාරීන් කැඳවා ගැනීම හා සම්බන්ධීකරණය කිරීම.

06. බලතල :-

ඉහත සඳහන් පරමාර්ථ හා කාර්යභාරයන් ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සංවිධාන සම්බන්ධීකරනය කරමින් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහ බල ප්‍රදේශයේ පොදු සංවර්ධන කටයුතු පිළිබඳ සුපරීක්ෂාකාරී වීමට සමිතියට බලය ඇත.

07. සාමාජිකත්වය :-

(අ) සාමාජිකත්වය ලැබීමට සුදුසුකම්.

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
ii. සමිති බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි අවුරුදු 18 ට වැඩි අයකු වීම.
iii. වෙනත් ග්‍රාම සංවර්ධන සමිතියක/කාන්තා සමිතියක සාමාජිකයකු නොවීම.

(ආ) සාමාජිකත්වය ලබා ගැනීම.

i. ආරම්භක රැස්වීමට සහභාගී වූ මෙන්ම ආරම්භක රැස්වීමට සහභාගී නොවූ එහෙත් සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ඇති අය විසින් සමිතිය පිළිගත් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර කාරක සභාවේ සාමාජිකයෙකුට ඉදිරිපත් කළ යුතුය.

ii. අයදුම්පත් සලකා බලා මහ සභාරැස්වීමේ ස්ථිර කිරීමට යටත්ව කාරක සභාව විසින් සාමාජිකයන් බඳවා ගත යුතුය.

(ඈ) සාමාජිකත්වය අහෝසි වීම.

i. මරණය සිදු වීම.

ii. සමිති බල ප්‍රදේශයේ පදිංචිය අතහැර යාම.

iii. සමිතිය මගින් ක්‍රියාත්මක කරන වැඩ සටහන් වලට ක්‍රියාශීලීව සහභාගී නොවීම නිසා හෝ මහ සභා හෝ කාරක සභා රැස්වීම් 03 කට එක දිගට නොකඩවා නොදන්වා සහභාගී නොවීම නිසා හෝ මහා සභාව විසින් වැඩිදෙනාගේ කැමැත්ත පරිදි සාමාජිකත්වය අහිමි කළ හැකිය.

iv. සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම.

v. සමිතියේ පරමාර්ථයන්ට පටහැනිව ක්‍රියා කිරීම ඔප්පු වීමෙන් සාමාජිකයන් වැඩිදෙනාගේ කැමැත්ත පරිදි සාමාජිකත්වය අහිමි කළ හැකිය.

(ඇ) කාරක සභාවේ සාමාජිකත්වය අහිමි වීම.

කාරක සභාවේ රැස්වීම් සඳහා පිළිගත හැකි සාධාරණ හේතුවක් නොදන්වා පිට පිට තෙවරක් සහභාගී වීම පැහැර හැරීමෙන් සාමාජිකත්වය අහෝසි වේ. සාමාජිකත්වය අහෝසි වීමෙන් ඔහු යම් නිලයක් දැරුවේ නම් එයද අහෝසි වේ. එසේ තනතුරු අහෝසි වූ බව සභාපති හෝ ලේකම් ක්‍රියාකාරී කමිටුවට දැනුම් දිය යුතුය යම් අවස්ථාවක ඔවුන් නොමැති නම් උප සභාපතිට හෝ උප ලේකම්ට එය කළ හැකිය. සති දෙකක් තුළදී සමිතිය එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කල යුතුය.

08. මහ සභා රැස්වීම සහ කාරක සභා රැස්වීම :-

i. මහ සභා රැස්වීම

අවම වශයෙන් මාස 04 කට වරක්වත් මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය. රැස්වීමට පැමිණෙන ලෙස දැනුම් දීම දින 07 කට කලින් ගමේ ප්‍රසිද්ධ ස්ථාන වල අලවන දැන්වීම් මාර්ගයෙන් කළ යුතුය.

ii. වාර්ෂික මහා සභා රැස්වීම

නව නිලධාරි මණ්ඩලයක් තෝරාගැනීමට සහ ප්‍රගති සමාලෝචනය කිරීමටද ඉදිරි වර්ෂය සඳහා සැලසුම් සකස් කිරීමටද සියලුම සාමාජිකයන්ගෙන් සැදුම්ලත් සංවත්සරික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය. මෙම රැස්වීමට ප්‍රාදේශීය ලේකම්ට, දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට සහ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට හා ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන්ට ආරාධනා කළ යුතුය.

iii. කාරක සභා රැස්වීම්

ආරම්භක රැස්වීමේදී නිලධාරින් තෝරා ගැනීමෙන් අනතුරුව මාස 01 කට වරක් වත් කාරක සභාව රැස්විය යුතුය. රැස්වීම පැවැත්වෙන දිනය දැනුම් දීම පෞද්ගලික නිවේදන මාර්ගයෙන් ලේකම් තැන විසින් රැස්වීමට දින 04 කට කලින් කළ යුතුය.

iv. නිලධාරින් තෝරා ගැනීමේ රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීමේදී වැඩි දෙනාගේ කැමැත්තෙන් නිලධාරි මණ්ඩලය තෝරා පත්කර ගත යුතුය. නිලධාරීන්ගේ නිල කාලය වර්ෂ 02 ක් වන්නේය. වාර්ෂික මහා සභා රැස්වීමට පෙර යම් තනතුරක් පුරප්පාඩු වුවහොත් වාර්ෂික මහා සභා රැස්වීමට පෙර පැවැත්වෙන මහ සභා රැස්වීමදී එම පුරප්පාඩුව පුරවා ගත යුතුය.

v. විශේෂ මහ සභා රැස්වීම

කාරක සභාවේ තීරණය මත හෝ සාමාජිකයන්ගේ 25% කට නොඅඩු පිරිසකගේ ලිඛිත ඉල්ලීමක් පිට හෝ ප්‍රාදේශීය ලේකම් ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී/ග්‍රාම සංවර්ධන නිලධාරීගේ ලිඛිත දැන්වීමක් පිට හෝ ලේකම් විසින් දින 07 ක් කල් දීමෙන් විශේෂ මහා සභාවක් කැඳවිය යුතුය.

vi. විශේෂ කාරක සභා රැස්වීම

කාරක සභා සාමාජිකයින්ගෙන් 1/3 ගේ ලිඛිත ඉල්ලීමක් හෝ ප්‍රාදේශීය ලේකම් ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී, ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ ලිඛිත දන්වීමක් පිට හෝ යටත් පිරිසෙයින් දින 05ක් කල් දීමෙන් විශේෂ කාරක සභා රැස්වීම් ලේකම් විසින් කැඳවිය යුතුය.

09. ගණ පූරණය :-

I. මහා සභා/විශේෂ මහ සභා හා සංවත්සරික මහා සභා රැස්වීම් වල ගණපූර්නයට සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ට වඩා සහභාගී විය යුතුය.

II. කාරක සභා සහ විශේෂ කාරක සභා රැස්වීම් වල ගණපූර්ණයට එහි සාමජික සංඛ්‍යාවෙන් 1/2 වඩා සහභාගී විය යුතුය.

10. නිලධාරීන් :-

01. ප්‍රධාන නිලධාරින් පත් කිරීම.

ආරම්භක රැස්වීම සඳහා පැමිණ සිටින පිරිස අතුරින් ප්‍රධාන නිලධාරින් පත්කරගනු ලැබේ. පාර්ලිමේන්තුවේ පළාත් සභාවක, මහ නගර සභාවක, නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක මහජන නියෝජිතයෙකු හට සමිතියේ සාමාජිකයෙකු විය හැකි නමුත් ග්‍රාම සංවර්ධන සමිතියක කාරක සභාවේ සාමාජිකයෝ වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ සමිතියේ නිලධාරි මණ්ඩලයට ඇතුලත් විය නොහැක. යම් සමිති නියෝජිතයෙකු මහජන නියෝජිතයෙකු ලෙස දිවුරුම් දුන්නේ නම් තව දුරටත් ග්‍රාම සංවර්ධන සමිතියෙහි ධූරය දැරීමට සුදුස්සෙකු නොවන්නේය.

01. සභාපති
02. ලේකම්
03. භාණ්ඩාගාරික
04. උප සභාපති
05. උප ලේකම්

02. කාරක සභිකයන්

බල ප්‍රදේශයේ සියලු ගම් ගොඩැලි හෝ විවිධ ජන කොට්ඨාස නියෝජනය වන පරිදි කාරක සභිකයන් වශයෙන් අවශ්‍ය ප්‍රමාණයන් පත් කර ගත හැක.

03. අනුශාසක

සමිතියේ අභිමතය පරිදි සුදුසු අය මේ සඳහා පත්කර ගත හැකිය.

04. උපදේශක

ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන නිලධාරී නිල වශයෙන් උපදේශක වන්නේය. සමිතියේ පොත්පත් හා සියලු කටයුතු පරීක්ෂා කිරීමට ඔහුට බලය තිබේ.

11. නිලධාරින් සතු කාර්යභාරයන්

01. සභාපති

i. කාරක සභාව/මහා සභාව/විශේෂ මහ සභාව/සංවත්සරික මහ සභාව මෙහෙයවීම.

02. ලේකම්

i. සියලු රැස්වීම් කැඳවීමට කටයුතු කිරීම.
ii. සමිතිය සතු පොත්පත් ලිපි ලේඛන නිවැරදිව ක්‍රමාණුකූලව පවත්වාගෙන යාම, සමිතිය වෙනුවෙන් ලිපි ගනු දෙනු කිරීම.
iii. කාරක සභාවේ හා මහ සභාවේ තීරණ අදාළ නිලධාරින්ට හා ආයතනවලට දැන්වීම සහ ලැබෙන ලිපි වලට අනුව ක්‍රියාත්මක වීම.

03. භාණ්ඩාගාරික

i. සමිතිය සතු මුදල් පිළිබඳ ආරක්ෂාව ද ගනුදෙනු පිළිබඳ වගකීමද භාණ්ඩාගාරික සතුය.
ii. ගණන් හිලව් පොත් පත් ක්‍රමාණුකූලව පවත්වාගෙන යාම.
iii. මුදල් වාර්තා කලට වේලාවට අදාළ ආයතනවලට ග්‍රාම සංවර්ධන නිලධාරි මගින් වාර්තා ඉදිරිපත් කිරීම.
iv. සමිතිය සතු මුදල් තත්වය හා ගනුදෙනු පිළිබඳව වාර්තා සකස් කර කාරක සභාවෙන් මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී මහා සභාවෙන්ද අනුමත කරගෙන ග්‍රාම සංවර්ධන නිලධාරිට හා අවශ්‍ය ආයතන වලට ඉදිරිපත් කිරීම. භාණ්ඩාගාරික ඉල්ලා අස්වුවහොත් ඔහු සතු මුදල් හා පොත් පත් ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලැබූවකුට පැවරිය යුතුය.
v. සමිතියේ ගණන් පරීක්ෂක ඉල්ලා සිටින ලේඛන ගණන් පරීක්ෂක වෙත ඉදිරිපත් කිරීම සහ ගණන් පරීක්ෂකගේ කාර්යයන් ඉටු කිරීමට සහාය වීම.

04. උප සභාපති

i. සභාපති නොමැති අවස්ථාවල ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම.

05. උප ලේකම්

i. ලේකම්ට සහාය වීම සහ ඔහු නොමැති අවස්ථා වලදී ඔහු වෙනුවට වගකීම දැරීම.

06. ගණන් පරීක්ෂක

i. ග්‍රාම සංවර්ධන සමිතියේ මුදල් හදල් පොත් පත් හා බඩු බාහිරාදිය පිළිබඳ පරීක්ෂා කර බැලීමට හා මහා සභාවට අවශ්‍ය වන අවස්ථාවලදී හා වර්ෂයකට වරක් ගිණුම් පිළිබඳ වාර්තා කිරීමට ගණන් පරීක්ෂකවරයෙකු තෝරා පත් කර ගත යුත්තේය. ඔහු නිලධාරි මණ්ඩලයට අයත් නොවන ස්වාධීන පුද්ගලයකු වන්නේය. ව්‍යවස්ථානුකූලව සමිතිය විසින් කරනු ලබන වියහියදම් පිළිබඳව පරීක්ෂා කොට බලා සමිතියේ මුදල් හා ගනුදෙනු පිළිබඳව තම සහතිකය හා නිරීක්ෂණ ඉදිරිපත් කළ යුතුය.

ii. රු.50,000.00 ක් හෝ ඊට වඩා වැඩි මුදලක් පිළිබඳව කටයුතු කරන ග්‍රාම සංවර්ධන සමිති සඳහා සමුපකාර සංවර්ධන නිලධාරින්ගේ හෝ වෙනත් පිළිගත් විගණකවරයෙකුගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය වන්නේය. ඒ සඳහා පාරිශ්‍රමිකයක් ගෙවීමට සිදු වුවහොත් එයද කල හැක්කේය.

11. භාරකාර මණ්ඩලය

i. සමිතිය සතු චංචල හා නිශ්චල දේපල යනාදිය ගැන වගකීම් දැරීමට හා ඒවා පාලනය කිරීම සඳහා සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුලත් වන සේ භාරකාර මණ්ඩලයක් පත් කල යුතුය. භාරකාර මණ්ඩලය නිලයෙන් මෙන්ම නාමයෙන්ද මහා සභාව විසින් පත් කළ යුතුය.
ii. භාරකාර මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් ඇති වූ නිසාම නිර්බල නොවිය යුතුය.
iii. වැටුප් දීමනා සම්මාන මුදල් වශයෙන් යම් පරිශ්‍රමිකයක් ලැබීමට සමිති නිලධාරින් ලෙස භාරකරුවන්ට හිමිකම් නොතිබිය යුතුය. නමුත් යම් කාර්යයක් ඉටු කිරීමෙහිලා ඔවුන් විසින් දරනු ලබන වියදම් සභා සම්මතයෙන් සමිතිය සතු මුදල් වලින් ලබා ගත හැකිය.

12. අරමුදල්

i. සාමාජික මුදල්

i. මසකට රු. .................................... : (මහා සභාව විසින් අනුමත කරනු ලබන මුදල්) කට අධික නොවන මුදලක් සාමාජිකයකුගෙන් සාමාජික මුදල් වශයෙන් අය කර ගත යුතුය.

13. විශේෂ අරමුදල්

විශේෂ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම පිණිස මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් හෝ වෙනත් ආයතනයකින් ලැබෙන විශේෂ අරමුදල් ගිණුමක තැන්පත් කළ යුතුය. එම මුදල් ආපසු ගැනීමේදී ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාම සංවර්ධන නිලධාරි රජය වෙනුවෙන් අත්සන් කළ යුතු අතර, සමිතිය වෙනුවෙන් භාණ්ඩාගාරික සහ ලේකම් හෝ සභාපති අත්සන් කළ යුතුය.

විශේෂ අවස්ථාවකදී යම් මුදලක් එකතු කිරීමට අවශ්‍ය වේ නම්, ප්‍රාදේශීය ලේකම්ගෙන් ඊට අනුමැතිය ලබා ගත යුතුය. එම මුදල් වියදම් කිරීම පිළිබඳ වාර්තාවක් මුදල් වියදම් කර අවසන් වූ වහාම මහ සභාවේ අනුමැතිය ඇතිව ග්‍රාම සංවර්ධන නිලධාරි මගින් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ කාල සීමාව මාස 03 නොඉක්මවිය යුතුය.

14. සමිතියේ අරමුදල්

සාමාජිකයින්ගෙන් එකතු කරන සාමාජික මුදල් පරිත්‍යාග සහ වෙනත් වැඩ සටහන් වලින් උපයාගනු ලබන මුදල් ආදියෙන් සමිතියේ ඒකාබද්ධ අරමුදල් සමන්විත වේ. එම අරමුදල් වලින් මහා සභාව අනුමත කරනු ලබන රු. 2000.00 ක අරමුදලක් භාණ්ඩාගාරික වෙත තබා ගත හැකි අතර ඉතිරිය රාජ්‍ය බැංකුවක තැන්පත් කළ යුතුය. එම මුදල් ආපසු ගැනීමේදී ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාම සංවර්ධන නිලධාරී අනුමත කළ යුතුය. එම අරමුදල් පොදු සංවර්ධන කාර්යයන් සඳහා වැය කල යුතු වේ. සමිතිය අක්‍රිය වූ විටක සමිතිය සතු මුදල් හා වත්කම් ප්‍රාදේශීය ලේකම් විසින් පවරාගෙන නැවත ප්‍රතිසංවිධානය කළ සමිතිය වෙත පැවරිය යුතුය.

15. ප්‍රගති වාර්තා

සාමාජික පවුල් වල සුභ සිද්ධිය තකා ගනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳව විස්තර වාර්තාවක් සහ සමිතිය මගින් කරන ලද වැඩ වල ප්‍රගතිය පිළිබඳ විස්තර වාර්තාවක් සෑම මසකටම වරක් ග්‍රාම සංවර්ධන නිලධාරි මගින් ප්‍රාදේශීය ලේකම්ට ඉදිරිපත් කල යුතුය.

16. නිලධාරින්ගේ ධූර කාලය

නිලධාරීන්ගේ ධූර කාලය වර්ෂ දෙකකි. එම වර්ෂ දෙක ඉකුත්වීමට පෙර නිලධාරියෙකු මියගිය විට හෝ අස්වූ විට හෝ අන්‍ය ආකාරයකින් ධූරය හිස් වූ විට එකී හිස්වූ ධූරය වෙනුවට යම් නිලයක් සඳහා සාමාජිකයකු පත් කරනු ලැබූ අවස්ථාවක ඒ සාමාජිකයා මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව ඔහුගේ පුරෝගාමීයාගේ ධූර කාලය ඉකුත් නොවී ඇති කාලසීමාව සඳහා ධූරය දැරිය යුතුය.

17. පොදු මුද්‍රාව

1. ග්‍රාම සංවර්ධන/කාන්තා සමිතියේ පොදු මුද්‍රාව, ග්‍රාම සංවර්ධනය සමිතියේ/කාන්තා සමිතියේ ලේකම්වරයා/වරිය භාරයේ තිබිය යුතු අතර සභාපතිවරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරි පිටදී හැර මෙම මුද්‍රාව ගිවිසුමකට හෝ වෙනත් සාධන පත්‍රයකට සමිතිය වෙනුවෙන් නොතැබිය යුතුය.

18. ව්‍යවස්ථාව සංශෝධනය

මූලික පරමාර්ථවලට පටහැනි නොවන පරිදි මෙම ව්‍යවස්ථාව තම බල ප්‍රදේශයට ගැලපෙන පරිදි සංශෝධන කර ගැනීමේ අයිතිය සාමාජිකයන්ට ඇත. සාමාජිකයන්ගේ 3/4 ක් සහභාගී වන රැස්වීමකදී පැමිණ සිටින සංඛ්‍යාවෙන් 2/3 ක ඡන්දයෙන් ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකිය. එම ව්‍යවස්ථා සංශෝධනයට පළාත් සභා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු අතර එසේ අනුමත දිනයෙන් පසුව ක්‍රියාත්මක වේ.

19. ව්‍යවස්ථා පරමාර්ථයන්ට පටහැනිව බලතල අයුතු ලෙස පාවිච්චි කරන ග්‍රාම සංවර්ධන සමිති කාන්තා සමිති ලියාපදිංචිය අහෝසි කිරීමට බස්නාහිර පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාට බලය ඇත.

පහත අත්සන් කරනු ලබන නිලධාරි මණ්ඩලය වන අප .............................. (දිනය) පවත්වන ලද ...................................................... (සමිතියේ නම) මහා සභාරැස්වීමේදී මෙම ව්‍යවස්ථාව සම්මත කරගත් බවත්, මෙය අප සමිතියේ ව්‍යවස්ථා මාලාව ලෙස පිළිගත් බවත් සහතික කරමු.

| *තනතුර* | | *නම* | *අත්සන* |
|---|---|---|---|
| 01. | සභාපති | | |
| 02. | ලේකම් | | |
| 03. | භාණ්ඩාගාරික | | |
| 04. | උප සභාපති | | |
| 05. | උප ලේකම් | | |

## II වන උපලේඛනය

***බස්නාහිර පළාතේ ග්‍රාම සංවර්ධන සමිතියක්/කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියක් ලියාපදිංචි කිරීම පිණිස ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍ර ආකෘතිය***

1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :
2. ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම හා අංකය :
3. ග්‍රාම සංවර්ධන සමිතියේ/කාන්තා සමිතියේ නම :
4. ගමේ ලියාපදිංචි පවුල් සංඛ්‍යාව :
   i. සාමාජිකත්වය ලබා ඇති පවුල් සංඛ්‍යාව :
   ii. සාමාජිකයන් සංඛ්‍යාව :
   iii. කුඩා සංවර්ධන ඒකක සංඛ්‍යාව :
5. සමිතිය ආරම්භ කිරීම සඳහා මහ සභා රැස්වීම පැවැත්වූ දිනය :
6. i. සභාපති ලෙස පත්වූ අයගේ නම සහ ලිපිනය :
   ii. ලේකම් ලෙස පත්වූ අයගේ නම සහ ලිපිනය :
   iii. භාණ්ඩාගාරික ලෙස පත්වූ අයගේ නම සහ ලිපිනය :
   iv. ගිණුම ආරම්භ කර ඇති බැංකුව :
   v. බැංකු ගිණුම් අංකය :
7. සමිතියේ වත් පොහොසත්කම් :
   i. භාණ්ඩාගාරික අතේ ඇති සමිතියේ මුදල් : රු. ..................................
   ii. බැංකුවල ගිණුම්ගත කර ඇති මුදල් : රු. ..................................
   iii. ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම : රු. ..................................
   iv. උපකරණ ආදියෙහි වටිනාකම : රු. ..................................

   එකතුව ==========

සභාපතිගේ අත්සන : ලේකම්ගේ අත්සන :
දිනය : දිනය :

ග්‍රාම සංවර්ධන නිළධාරි අත්සන
දිනය :

ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය : ප්‍රාදේශීය ලේකම්

**III** වන උපලේඛනය

*ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩල ව්‍යවස්ථාව*

1. නාමය :

   .......................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලය නමින් හැඳින්වේ.

2. ලිපිනය :

   ලේකම්,

   ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලය,

   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

   ...................................................... .

3. බල ප්‍රදේශය : ................................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වේ.

4. අරමුණු :

   1. ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා ග්‍රාම සංවර්ධන සමිති ප්‍රවර්ධනය කිරීම සඳහා ආධාර ලබා දීම.
   2. එම සමිතිවල පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා සහය දීම.
   3. දිස්ත්‍රික් බලමණ්ඩල නියෝජනය කිරීම.
   4. ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීම.
   5. ප්‍රදේශයේ ජනතාවගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්ත්වයන් නංවාලීම.
   6. ප්‍රදේශයේ ජනතාවගේ භෞතික පහසුකම් වැඩි දියුණු කිරීම.
   7. වෙනත් සමිති සමාගම් හා සංවිධාන සමඟ සම්බන්ධිකරණයක් ඇති කිරීම.

5. ව්‍යුහය, සාමාජිකත්වය, ධුර කාලය

   1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම්වලින් 51%ක ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවා ලියාපදිංචි කළ පසු ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලය පිහිටුවිය යුතුය.
   2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලියාපදිංචි ක්‍රියාකාරී ග්‍රාම සංවර්ධන සමිතිවල කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිවල ගරු සභාපති සහ ලේකම්වරුන්ට ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සාමාජිකත්වය හිමිවේ.
   3. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සංවර්ධන නිළධාරි එහි ලේකම් වන්නේය.
   4. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති, උප සභාපති කාරක සභිකයන් 7 දෙනෙකු බලමණ්ඩල රැස්වීමේදී ඡන්දයෙන් හෝ සම්මුතියෙන් තෝරා පත් කර ගත යුතුය. මෙහිදී මුදල් කටයුතු සිදු නොකරන බැවින් භාණ්ඩාගාරික වරයෙක් තෝරා පත් කර ගනු නොලැබේ.
   5. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයේ නිල කාලය අවුරුදු 02 ක් වන්නේය. නමුත් ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයේ තේරී පත් වූ සභාපතිවරයාගේ නිල කාලය ඔහු නියෝජනය කරන ග්‍රාම සංවර්ධන සමිතියේ නිල කාලයට සමාන වන්නේය, ප්‍රාදේශීය බල මණ්ඩලයේ නිල කාලයට පෙරාතුව සභාපතිගේ නිල කාලය අහෝසි වන්නේ නම් ප්‍රාදේශීය බල මණ්ඩලයේ ඉතිරි කාලය සඳහා වෙනත් සාමාජිකයෙකු සභාපති ලෙස පත් කළ හැක. නිල කාලය අහෝසි වන ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ කාල වකවානු සහිත ලේඛනයක් ලේකම් (ග්‍රාම සංවර්ධන නිලධාරි) විසින් අනිවාර්යයෙන් පවත්වාගෙන යා යුතුයි.

6. සාමාජිකත්වය අහෝසි වීම ;

   (අ) ග්‍රාම සංවර්ධන සමිතියක සභාපති ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන්,

   (ආ) තමන් නියෝජනය කරන ග්‍රාම සංවර්ධන සමිතියේ නිළ කාලය අහෝසි වීමෙන්,

   (ඇ) පිට පිට වාර තුනක් ප්‍රාදේශීය බලමණ්ඩල රැස්වීම්වලට දැනුම් නොදී සහභාගී නොවීමෙන්,

   (ඈ) ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීමෙන් (සභාවේ 2/3 ක ඡන්දයකින් සම්මත වීමෙන් තනතුරෙන් හෝ සාමාජිකත්වයෙන් ඉවත් කළ හැක.)

   (ඉ) සාමාජිකයාගේ මරණයෙන්,

   (ඊ) පදිංචිය අතහැර යාමෙන්.

7. මහ සභා රැස්වීම
(අ) ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩල මහ රැස්වීම මාස 03 කට වරක්වත් පැවැත්විය යුතුය.

8. කාරක සභා රැස්වීම
ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයේ කාරක සභා රැස්වීම මාසයකට වරක් පැවැත්විය යුතුය.

9. විශේෂ මහ සභා රැස්වීම්/විශේෂ කාරක සභා රැස්වීම්
සාමාජිකයන්ගෙන් 1/3ක ලිඛිත ඉල්ලීමක් කළ විට හෝ කාලීන හදිසි අවස්ථාවයන් අනුව අදාළ බලප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කර, ග්‍රාම සංවර්ධන නිලධාරි (ලේකම්) විසින් විශේෂ මහ සභා රැස්වීමක්/කාරක සභා රැස්වීමක් කැඳවිය යුතුය.

10. ගණ පූරණය
ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයේ මහ සභා රැස්වීම්, විශේෂ මහ සභා රැස්වීම් සමඟ සංවත්සරික මහ සභා රැස්වීම්වලදී ගණපූර්ණය සාමාජික සංඛ්‍යාවෙන් 1/3ක් විය යුතුය. විශේෂ කාරක සභා රැස්වීමකදී ගණපූරණය 1/2ක් වත් විය යුතුය.

11. අනු කමිටු පත් කිරීම
ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයේ වැඩ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් පරිදි අනු කමිටු 5ක් පත් කළ යුතුය. මෙම කමිටුවලට අයත් කාර්යභාරය ඉටු කිරීම සඳහා එම විෂය පිළිබඳ ප්‍රවීණයන් පත් කර ගැනීමට වග බලා ගත යුතුය.

1. ආගමික හා සංස්කෘතික කමිටුව
2. ආර්ථික හා සැලසුම් කමිටුව
3. ශ්‍රමදාන හා කෘෂිකර්ම කමිටුව
4. සෞඛ්‍ය හා පරිසර කමිටුව
5. අධ්‍යාපන හා පුහුණු කමිටුව

මෙම අනු කමිටුවක සාමාජික සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ ප්‍රාදේශීය බලමණ්ඩලය විසිනි. මෙම අනු කමිටුවල අධීක්ෂණ කටයුතු කරනු ලබන්නේ අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා හා ග්‍රාම සංවර්ධන නිලධාරි විසිනි.

12. ප්‍රාදේශීය බලමණ්ඩලය විසුරුවා හැරීම
ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයේ පරමාර්ථවලට පටහැනිව කටයුතු කරන, අකර්මන්‍ය හා බලය අනිසි ලෙස පාවිච්චි කරන හෝ, ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ 10(2) උපවගන්තිය ප්‍රකාර වංචා හෝ අක්‍රමිකතා සිදු වී ඇතැයි පවත්වන ලද පරීක්ෂණයකින් හෙළිදරව් වුවහොත් එකී ප්‍රාදේශීය බලමණ්ඩලය විසුරුවා හැරීමට ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂට බලය ඇත්තේය.

මෙම ව්‍යවස්ථාව ........................................ දින පැවති මහ සභා රැස්වීමේ දී සම්මත කර ගත් බවත්, මෙය අප ප්‍රාදේශීය බලමණ්ඩලයේ ව්‍යවස්ථා මාලාව ලෙස පිළිගත් බවත් සහතික කරමු.

| | |
|---|---|
| ........................................................ | ........................................................ |
| සභාපති | ලේකම් |

කාරක සභිකයන්

| | | |
|---|---|---|
| 1. ........................................................ | 2. ........................................................ | 3. ........................................................ |
| 4. ........................................................ | 5. ........................................................ | 6. ........................................................ |
| 7. ........................................................ | | |

**IV** වන උපලේඛනය

*ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩල ව්‍යවස්ථාව*

1. නාමය ඃ
   ...................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලය නමින් හැඳින්වේ.
2. ලිපිනය ඃ
   ලේකම්,
   ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලය,
   ...................................................... ,
   ...................................................... .
3. බල ප්‍රදේශය ඃ ................................................. දිස්ත්‍රික්කය වේ.
4. අරමුණු ඃ
   1. දිස්ත්‍රික්කය තුළ ග්‍රාම සංවර්ධන සමිති ප්‍රවර්ධනය සඳහා සහය දීම, උපදෙස් හා ආධාර දීම.
   2. ප්‍රාදේශීය බලමණ්ඩලවල ග්‍රාම සංවර්ධන සැලසුම් එකතු කර දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන සැලැස්ම සකස් කිරීම.
   3. දිස්ත්‍රික්කයේ පවතින පරිපාලන සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම සකස් කිරීම.
   4. බහුජන සංවිධාන සමඟ සහයෝගය වර්ධනය වන පරිදි කටයුතු කරමින් දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.
   5. පළාත් බලමණ්ඩලය නියෝජනය කිරීම.
5. ව්‍යුහය, සාමාජිකත්වය, ධුර කාලය
   1. දිස්ත්‍රික් බලමණ්ඩලයේ සභාපතිවරයා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලවල නියෝජනයෙන් පත් කර ගනු ලැබේ. දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි නිලබලයෙන් එහි ලේකම් වන්නේය. දිස්ත්‍රික් ලේකම් නිලබලයෙන් එහි අනුශාසක වන්නේය.
   2. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය බලමණ්ඩලවල සභාපතිවරුන්ගේ නියෝජනයෙන් හා ලේකම්වරුන්ගේ නියෝජනයෙන් දිස්ත්‍රික් බලමණ්ඩල පිහිටුවනු ලැබේ.
   3. දිස්ත්‍රික්කයේ බලමණ්ඩලයේ ගරු සභාපති, උප සභාපති, කාරක සභිකයන් 7 දෙනෙකු දිස්ත්‍රික් බලමණ්ඩල මහ සභා රැස්වීමේ දී පත් කළ යුතුය. මෙහිදී මුදල් කටයුතු සිදු නොකරන බැවින් භාණ්ඩාගාරිකවරයෙක් තෝරා පත් කර ගනු නොලැබේ.

      ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයක ධුර කාලය අවුරුදු 02 ක් වන්නේය. දිස්ත්‍රික් බලමණ්ඩලයේ නිල කාලයට පෙරාතුව සභාපතිගේ නිල කාලය අහෝසි වන්නේ නම් බලමණ්ඩලයේ ඉතිරි කාලය සඳහා වෙනත් සාමාජිකයෙකු සභාපති ලෙස පත් කළ හැක.
6. සාමාජිකත්වය අහෝසි වීම
   (1) තමන් නියෝජනය කරන සමිතියේ නිල කාලය අහෝසි වීමෙන්
   (2) ග්‍රාම සංවර්ධන සමිතියක සභාපති ධූරයත්, ලේකම් ධූරයත් ඉල්ලා අස් වීමෙන් හෝ ඉවත් කිරීමෙන්
   (3) ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීමෙන්
   (4) නොකඩවා රැස්වීම් වාර තුනකට නොදන්වා නොපැමිණීමෙන් හෝ සාමාජිකයාගේ මරණයෙන්
   (5) පදිංචිය අතහැර යාමෙන්
7. මහ සභා රැස්වීම
   දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩල මහ රැස්වීම මාස 03 කට වරක්වත් පැවැත්විය යුතුය.
8. කාරක සභා රැස්වීම
   ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයේ කාරක සභා රැස්වීම මාස 01 කට වරක් පැවැත්විය යුතුය.
9. විශේෂ මහ සභා රැස්වීම්/විශේෂ කාරක සභා රැස්වීම්
   සාමාජිකයන්ගෙන් 1/3ක ලිඛිත ඉල්ලීමක් කළ විට හෝ කාලීන හදිසි අවස්ථාවයන් අනුව ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කර, දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි (ලේකම්) විසින් විශේෂ මහ සභා රැස්වීමක්/කාරක සභා රැස්වීමක් කැඳවිය යුතුය.

10. ගණ පූරණය

ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයේ මහ සභා රැස්වීම්, විශේෂ මහ සභා රැස්වීම්වලදී ගණපූර්ණය සාමාජික සංඛ්‍යාවෙන් 1/3ක් විය යුතුය. විශේෂ කාරක සභා රැස්වීමකදී ගණපූරණය 1/2ක් වත් විය යුතුය.

11. අනු කමිටු පත් කිරීම

ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයේ වැඩ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් පරිදි අනු කමිටු තෝරා පත් කර ගත හැක. මෙම කමිටුවලට අයත් කාර්යභාරය ඉටු කිරීම සඳහා එම විෂය පිළිබඳ ප්‍රවිණයන් පත් කර ගැනීමට කටයුතු කළ හැක.

1. ආගමික හා සංස්කෘතික අනුකමිටුව
2. ආර්ථික හා සැලසුම් අනුකමිටුව
3. ශ්‍රමදාන හා කෘෂිකර්ම අනුකමිටුව
4. සෞඛ්‍ය හා පරිසර අනුකමිටුව
5. අධ්‍යාපන හා පුහුණු අනුකමිටුව

මෙම අනු කමිටුවක සාමාජික සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ දිස්ත්‍රික් බලමණ්ඩලය විසිනි. මෙම අනු කමිටුවලින් හා රැස්වීම්වලදී ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් බලමණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය. එම තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ තීරණ අනුමැතිය හා ප්‍රතිපාදන පළාත් බල මණ්ඩල විසින් ලබා දෙනු ඇත.

12. දිස්ත්‍රික් බලමණ්ඩලය විසුරුවා හැරීම

ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයේ ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරන, අකර්මණ්‍ය හා බලය අනිසි ලෙස පාවිච්චි කරන හෝ, ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ 10(2) උපවගන්තිය ප්‍රකාර වංචා හෝ අක්‍රමිකතා සිදු වී ඇතැයි පවත්වන ලද පරීක්ෂණයකින් හෙළිදරව් වුවහොත් එකී දිස්ත්‍රික් බලමණ්ඩලය විසුරුවා හැරීමට ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේය.

මෙම ව්‍යවස්ථාව .......................................... දින පැවති මහ සභා රැස්වීමේ දී සම්මත කර ගත් බවත්, මෙය අප දිස්ත්‍රික් බලමණ්ඩලයේ ව්‍යවස්ථා මාලාව ලෙස පිළිගත් බවත් සහතික කරමු.

| | |
|---|---|
| ........................................................ | ........................................................ |
| සභාපති | ලේකම් |

කාරක සභිකයන්

1. ........................................................
2. ........................................................
3. ........................................................
4. ........................................................
5. ........................................................
6. ........................................................
7. ........................................................

**V** වන උපලේඛනය

*පළාත් ග්‍රාම සංවර්ධන බලමණ්ඩල ව්‍යවස්ථාව*

1. නාමය :

.......................................... පළාත් ග්‍රාම සංවර්ධන බලමණ්ඩලය නමින් හැඳින්වේ.

2. ලිපිනය :

ලේකම්,

පළාත් ග්‍රාම සංවර්ධන බලමණ්ඩලය,

...................................................... ,

...................................................... .

3. බල ප්‍රදේශය : බස්නාහිර පළාත (කොළඹ/ගම්පහ/කළුතර දිස්ත්‍රික්කය) වේ.
4. අරමුණු :
   1. ජාතික ප්‍රතිපත්තියට අනුව පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කිරීම.
   2. තම පළාත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.
   3. පළාත් ග්‍රාම සංවර්ධන අරමුදලක් පිහිටුවීම හා පාලනය කිරීම.
   4. පළාතේ ග්‍රාම සංවර්ධනයෙහි ලා අවශ්‍ය වන විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
   5. පළාත් ග්‍රාම සංවර්ධන පුහුණු කටයුතු.
   6. ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බලමණ්ඩල අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම හා එම සමිති හා බලමණ්ඩලවලින් ලැබෙන යෝජනා හා අදහස් පිළිබඳව අවධානය යොමු කර තීරණයක් ගැනීම, අවශ්‍ය නිර්දේශ හා මඟ පෙන්වීම.
5. ව්‍යුහය
   1. පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ
   2. දිස්ත්‍රික් තුනේ දිස්ත්‍රික් බල මණ්ඩලවල සභාපතිවරුන් සහ දිස්ත්‍රික් තුනේ බලමණ්ඩලවල සාමාජිකයන් අතරින් එක් දිස්ත්‍රික්කයකට එක් අයෙකු බැගින් අමාත්‍යවරයා විසින් පත් කරන නියෝජිතයන් තිදෙනෙක්
   3. දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන්/දිස්ත්‍රික් තුනට අදාළ වන පරිදි ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරු තිදෙනෙකු
   4. පළාත් සහකාර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ
   5. සෑම දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බලමණ්ඩලයකම සභාපතිවරුන්, ලේකම්වරුන් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂගේ නියෝජනයෙන් පළාත් බලමණ්ඩලය පිහිටුවනු ලැබේ.
6. සාමාජිකත්වය
   (1) දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බලමණ්ඩලයකින්ම සභාපතිවරු හා ලේකම්වරු වීම.
   (2) අමාත්‍යවරයා විසින් පත්කරන නියෝජිතයින්
   (3) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ
   (4) ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරු
   (5) දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන්
7. සාමාජිකත්වය අහෝසි වීම
   (1) තමන් නියෝජනය කරන සමිතියේ නිල කාලය අහෝසි වීමෙන්
   (2) ප්‍රාදේශීය බලමණ්ඩලයකින් /දිස්ත්‍රික් බලමණ්ඩලයකින් සිය තනතුරු හා සාමාජිකත්වය අහෝසි වීම
   (3) ඉල්ලා අස්වීමෙන්
   (4) ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කිරීමෙන්
   (5) පදිංචිය අතහැර යාමෙන්
   (6) මරණයෙන්
8. පළාත් බලමණ්ඩලයේ සභාපති පත් කිරීම
   පළාත් බලමණ්ඩලය, දිස්ත්‍රික් බලමණ්ඩල වල සභාපතිවරු සහ ලේකම්වරු අතරින් දිස්ත්‍රික් තුන නියෝජනය වන පරිදි අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන තිදෙනෙකුගෙන් සමන්විත වන්නේය. ඔවුන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරන තැනැත්තෙකු පළාත් බලමණ්ඩලයේ සභාපති වන්නේය.
   පළාත් බලමණ්ඩලයේ ලේකම්, සහකාර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයෙක් විය යුතුය.
9. රැස්වීම්
   පළාත් බලමණ්ඩලයේ රැස්වීම් සෑම මාසයකට වරක්ම පැවැත්විය යුතුය. එහි ගණපූර්නය 6ක් වන්නේය.
10. අරමුදල්
   (1) පළාත් බලමණ්ඩලයේ පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම සහ වියදම් දැරීම සඳහා අරමුදලක් පිහිටුවා ගනු ලැබේ.
   (2) මෙම අරමුදලේ ගිණුමට පහත දැක්වෙන ප්‍රභවයන්ගෙන් මුදල් ප්‍රේෂණය කරනු ලැබේ.
   i. රජයෙන් ලැබෙන ප්‍රදානයන්

ii. පළාත් සභා අරමුදලින් කරනු ලබන ප්‍රදාන

iii. ග්‍රාම සංවර්ධන සමිතිවල ගිවිසුම්ගත සේවා වලින් ලැබෙන ප්‍රතිලාභයෙන් 1/5ක්

iv. දේශීය හෝ විදේශීය පුද්ගලයන්ගෙන් හෝ ආයතන මගින් (පරිත්‍යාගයන්, අධාර) ලැබෙන මුදල්

v. වෙනත් නෛතික මාර්ගයකින් ලැබෙන ආදායම්

(3) මෙම අරමුදල, ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක හෝ ජංගම ගිණුමක තැන්පත් කල යුතුය.

(4) මෙම මුදල් ආපසු ගැනීමේදී ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ සහ ලේකම් (ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂ) යන අය රජය වෙනුවෙන් ද සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලැබූ පළාත් බල මණ්ඩල නියෝජිතයෙක් පළාත් බල මණ්ඩලය වෙනුවෙන්ද අත්සන් කළ යුතුය.

11. මූල්‍ය කටයුතු, ගිණුම් තැබීම හා විගණනය

1. මෙම අරමුදලින් කරනු ලබන සිය ගෙවීම් රීති මඟින් නියම කර ඇති ආකාරයට සිදු කල යුතුය.

2. අවශ්‍ය නොවන්නා වූ අරමුදලේ සියළුම මුදල් වහාම රාජ්‍ය බැංකුවක හෝ රාජ්‍ය අරමුදල්වල ආයෝජනය කරනු ලැබිය යුතුය.

3. මෙම අරමුදලේ ගිණුමේ මූල්‍ය පාලනය අමාත්‍යාංශ ලේකම් විසින් කරනු ලබන අතර, මුදල් ගණුදෙනු පිළිබඳ වාර්ෂික අය වැය වාර්තාව, ගිණුම් විගණන වාර්තාව ද ඔහු විසින් බස්නාහිර පළාත් ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා මගින් බස්නාහිර පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

4. එහි මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතුය.

5. එක් එක් ලිත් වර්ෂය ඉක්මවූ පසු ගිණුම් හා වාර්ෂික වාර්තාව හැකිතාක් ඉක්මණින් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් සකස් කළ යුතුය. එක් එක් ලිත් වර්ෂය වෙනුවෙන් පරිපූර්ණ ලෙස හා උචිත ලෙස ගිණුම් පවත්වා ගෙන යාමට පළාත් බලමණ්ඩලයේ ලේකම්වරයා විසින් විධිවිධාන සැලැස්විය යුතුය.

6. අමාත්‍යවරයා විසින් හැකිතාක් ඉක්මණින් එක් එක් ලිත් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාද අරමුදලේ ගිණුම් විගණන වාර්තාවද බස්නාහිර පළාත් සභාව හමුවේ තැබිය යුතුය.

12. මුදල් වියදම් කිරීම

පහත සඳහන් වියදම් පළාත් බලමණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියෙන් සිදු කළ හැක.

1. ග්‍රාම සංවර්ධන සමිති විසින් සකස් කර ඉදිරිපත් කරනු ලබන ප්‍රාදේශීය/දිස්ත්‍රික්/පළාත් බල මණ්ඩලය අනුමත කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති සඳහා ශක්‍යතාව පදනම් කර ගනිමින් ආයෝජනය කිරීම.

2. පළාතේ ග්‍රාම සංවර්ධන වැඩසටහන් වර්ධනයෙන් ලා වෘත්තීය පුහුණු වැඩ සටහන් වෙනුවෙන් වැය කිරීම.

3. ග්‍රාම සංවර්ධන සමිති අභිවෘද්ධිය සඳහා වූ පුහුණු වැඩසටහන් වෙනුවෙන් වැය කිරීම.

4. ප්‍රාදේශීය/දිස්ත්‍රික්/පළාත් බල මණ්ඩල සඳහා වූ පරිපාලන වියදම්.

5. ග්‍රාම සංවර්ධනයෙහි ලා ඉවහල් වන සමාජීය, ආර්ථික, සංස්කෘතිමය හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා වන වියදම්

13. මුදල් සාවද්‍ය පරිහරණය, වංචා හෝ අක්‍රමිකතා

1. ව්‍යවස්ථානුකූලව පත්වූ ග්‍රාම සංවර්ධන සමිතියක, ප්‍රාදේශීය බලමණ්ඩලයක දිස්ත්‍රික් බලමණ්ඩලයක මුදල් සාවද්‍ය පරිහරණය හෝ අක්‍රමිකතාව සිදුවී ඇතැයි වාර්තා වූ විටෙක අමාත්‍යාංශ ලේකම් විශේෂයෙන් බලය පවරන ලද නිලධාරියෙකු මඟින් ප්‍රාරම්භක වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, එසේ වංචාව, අක්‍රමිකතා සිදුවී ඇති බවට සෑහීමකට පත්විය හැකි ප්‍රමාණවත් කරුණු ඇති විටක හෝ මාස 06 කාලයක් එකී බලමණ්ඩලය අක්‍රීයව ඇති බවට ප්‍රමාණවත් කරුණු ඇති විටෙක දී එකී බලමණ්ඩලය විසුරුවා හැරීමට අදාළ විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාට බලය ඇත්තේය.

2. විසුරුවා හරින ලද ග්‍රාම සංවර්ධන සමිතියකට හෝ ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයකට හෝ දිස්ත්‍රික් බලමණ්ඩලයකට හෝ දිස්ත්‍රික් බලමණ්ඩලයකට හෝ පළාත් බලමණ්ඩලයට අයත් සියලුම චංචල හා නිශ්චල දේපල, ගිණුම් ලේඛන, සාමාජික නාම ලේඛන, පරිහරණයට අදාළ සියලුම ලිපි ගොනු, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරේ. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නිලධාරියෙකුට එම දේපළ භාරදී නිදහස් වනතුරු, විසුරුවා හරින ලද නිලධාරි මණ්ඩලය සිය වගකීමෙන් නිදහස් නොවේ.

14. ධූර කාලය

පළාත් බලමණ්ඩලයේ ධූර කාලය අවුරුදු 2ක් වන්නේය. පත් වූ සභාපතිවරයාගේ නිල කාලයට පෙර ඔහු නියෝජනය කරන ග්‍රාම සංවර්ධන සමිතියේ නිල කාලය අහෝසි වුවහොත්, ඉතිරි කාල සීමාව සඳහා වෙනත් සාමාජිකයෙකු සභාපති වශයෙන් බලමණ්ඩල රැස්වීමේදී විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාව මත තෝරා පත් කර ගත යුතුය.

15. පොදු මුද්‍රාව

පළාත් බලමණ්ඩලය නමින් පොදු මුද්‍රාවක් සැකසිය යුතු වන්නේය.

16. ව්‍යවස්ථා සංශෝධනය

මූලික පරමාර්ථවලට පටහැනි නොවන පරිදි මෙම ව්‍යවස්ථාව තම පළාතට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමේ බලය පළාත් බලමණ්ඩලයට ඇත. සහභාගි වන රැස්වීමක දී 2/3 ක ඡන්දයෙන් ව්‍යවස්ථාව සංශෝධනය කල හැක. එම ව්‍යවස්ථා සංශෝධනයට පළාත් ග්‍රාම සංවර්ධන අමාතයාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගත යුතු අතර එසේ අනුමත දින සිට ක්‍රියාත්මක වේ.

..................................... දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සම්මත කර ගත් බවත්, මෙ අප පළාත් බලමණ්ඩලයේ ව්‍යවස්ථාමාලාව ලෙස පිළිගත් බවත් සහතික කරමු.

| | | |
|---|---|---|
| ................................................................ | ................................................................ | ................................................................ |
| සභාපති, | ග්‍රා. සං. අධ්‍යකෂ | ලේකම්තුමා |

**VI** වන උපලේඛනය

ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු
සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් හා ග්‍රාම සංවර්ධන
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය (බස්නාහිර පළාත)

ග්‍රාම සංවර්ධන සමිතිය/කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය ලියාපදිංචි කිරීමේ සහතිකය.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ..........................................................................................................................................
ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංකය .............................................................................................................................
.............................................................................................................................................................................................
ගමෙහි/යායෙහි/වත්තෙහි පිහිටුවා ඇති ............................................................................................................................
ග්‍රාම සංවර්ධන සමිතිය/කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය ..............................................................................................
අංකය යටතේ ලියාපදිංචි කරන ලදී.

................................................................
ප්‍රාදේශීය ලේකම්

දිනය : ...................................................................

සමිතියේ භාරකාර මණ්ඩලය පසුපිට දැක්වේ.

| භාරකාර මණ්ඩලය | | | | | |
|---|---|---|---|---|---|
| පත් කළ දිනය | ගරු සභාපති | ගරු ලේකම් | ගරු භාණ්ඩාගාරික | ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන | දිනය |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

09 - 293

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.